# පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

# The Warrior

අගෝස්තු මාසේ අග පන්හිඳයි, පින්සලයි, පැන්සලයි බලන්න ගිය අපේ අළුත් විදියේ ප්‍රසංගයක් ගැන වචනයක් දෙකක් ලියන්න ඕන කියලා හිතාගෙනමයි පන්හිඳ ගෙදර ආවෙ. ඒත් මොන මොනවා හරි දේවල් නිසා ඒ ලියමන ටිකක් පමා වුණා. ඒත් ප්‍රසංගයේ සමරුව තව ම පන්ගේ මේසේ උඩ.

"මේ සුවනියර් එකත් ළඟ තියාගෙන ඉන්න එකේ මොනවත් ලිව්වනං නේද හොඳ?" පින්සල පන්හිඳට මතක් කළා.

"මොනවත් ලියලා බෑ. හුස්මක් අරගෙන ටිකක් හොයලා බලලා ලියන්න ඕන වැඩක් මේක. ඒකයි ටිකක්....."

"ඇති , ඇති..... කිතුලට ගිය මනුස්සයටත් කියන්න දෙයක් තිබුණනනේ." පැන්සල හිනා වුණා.

"අද ම ලියනවා.... අද ....... !" පන් සමරුව අරගෙන ලියන මේසයේ වාඩි වුණා. පින්, පැන් දෙන්නා නොකර සද්ද එහාට මෙහාට වුණා....

හයවෙනි වතාවටත් රංගන හා උදුම්බරා නර්තන කණ්ඩායම ඉදිරිපත් කළ "රංගාභිෂේක vi" නම් කෙරුණේ ද වොරියර්" (The Warrior) නමින්. ප්‍රසංගයෙන් ප්‍රසංගයට නැවුම් යමක් වේදිකාප්‍රාප්ත කරවීමට උත්සාහ කරනා රංගන -උදුම්බරා යුවල තමන්ගේ වෘත්තීය මට්ටමේ ශිෂ්‍ය කණ්ඩායමත්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය කණ්ඩායමත්, දෙවන පෙළ ශිෂ්‍ය කණ්ඩායමත්, කණිෂ්ඨ ශිෂ්‍ය කණ්ඩායමත් එකම මාතෘකාවක් යටතේ පෙළගැස්වීමට සමත් වූහ.

"වොරියර්" යනු සටන්කාමියා යන අරුත ගෙන දෙයි. ඒ අනුව සටන්කාමියෙකු කේන්ද්‍රකොටගෙන ඒ වටා අන්‍යන් ගොනු කරවීමට නර්තනය උපයෝගී කරගත් අපූරු නර්තන ප්‍රසංගයකි, මෙවර රංගාභිෂේකය. සටන් කිරීමත් , සටන් කාමීත්වයත් අපේ ඉතිහාසය පුරා කියවේ. නොයෙකුත් විදේශික ආක්‍රමණ නිසාත්, රට තුල අභ්‍යන්තර ගැටුම් නිසාත් එය අපගේ ලෙයට කැවී ඇති සේ ය. එයට ම අනන්‍ය වූ " අංගම් පොර" වැනි සටන් ක්‍රමවේද ප්‍රගුණ කළ රාජ්‍ය නායකයෝ පවා එකල සිටියහ. මින් මුලටම කියවෙන නමකි සීතාවක රාජසිංහ නිරිඳුන්ගේ නාමය. ටිකිරි බණ්ඩාර කුමරා ලෙස කුමාර දිවියේ පටන් ම අංගම්පොර සටන්කාමියෙකු වූ සීතාවක රාජසිංහයන් ගේ මුළු රාජ්‍ය සමයම, මුළු දිවියම විදේශ ආක්‍රමණිකයින් හමුවේ කළ සටනින් ඇවිල ගියේ ය. විදේශිකයින් අතට දිවයින පත්වූ විගස ඔවුන් කලේ එවන් සටන්කාමීන් සහ සටන් ක්‍රම විනාශ කිරීමය.

අපගේ නර්තනය අපගේ සටන් ක්‍රම සමඟ නියමාකාරයෙන් මුසුවන්නේ මේ පරිසරයේදීයි. අංගම්පොර ඇතුළු අපේ සටන් ක්‍රම නර්තනය හා මුසුකොට නර්තන වින්‍යාසය ලෙසින් රහසේ ඉදිරියට ගෙන ඒමට අපගේ දෑ හිතකාමීහු සමත් වූහ. එනයින් මෙම සටන් නර්තන වින්‍යාස නොදැනුවත්ව ම අප හා බැඳී පවතියි. රන්වල බලකාය "හෙළේ මනාලී" , "යක්කු බොලව් අපි" වැනි ගී සඳහා ඉදිරිපත් කළ නර්තන අංග මෙවන් සටන් නර්තන වින්‍යාස අනුව නිර්මාණය වූ ඒවා විය.

සටන් කාමීන්ගෙන් අනූන වූ අපගේ ඉතිහාසයෙන් රංගත - උදුම්බරා යුවල සිය "වොරියර්" ලෙස තෝරාගන්නේ සූර්ය වංශයේ තේජවන්ත රාවණා රජතුමායි. රාවණා නරේන්ද්‍රයාණන්ද අති දක්ෂ අංගම් ශිල්ප සටන්කාමියෙකු බව ඉතිහාසයේ කියැවේ. විශ්වාසට දාව කෙකසී බිහි කළ රාවණා තරුණයා ලංකාපුරය මාළිගය වට කොට එහි බලය අල්ලාගෙන රජ වූයේ 17 වන වියේදීය.

ප්‍රසංගයේ මුල් අංගය "රාවණාගේ නැවත ඉපදීමයි." මේ අංගයෙන් අප පැවත එන්නේ කවුරුන්ගෙන් ද, අප කවුරුන් ද යන වග කියා පායි. අපගේ පාරම්පරික නාද රටා මූලික කොට ගෙන කට හඬේ ශක්තිය පෙන්වන අංගයකට දෙවනුව ප්‍රසංගය යොමු වෙයි. මව් බිමේ අලංකාර බව පෙන්වන, එහි සිරිත් විරිත් ඉස්මතුවන අළුත් අවුරුද්ද පිළිබඳව කියවෙන, අංග දෙකක් ඉන් අනතුරුව එක් වන්නේ දරු දැරියන්ගේ කුසලතා මොනවට විදාලමිනි. අසදෘෂ වන්නමට ඉදිරිපත් කළ නර්තනය වඩාත් සාම්ප්‍රදායික නර්තන න්‍යායන් වේදිකාප්‍රාප්ත කරවූ අංගයකි. සිංහයකුගේ බලය පෙන්වන සිංහරාජ වන්නම , මෙන් ම සාම්ප්‍රදායික උඩරට වෙස් නැටුම සහ තේරී වාද්‍ය සංධ්වනියද අපේක්ෂමින් ප්‍රේක්ෂකාගාරය උණුසුම් කරවීමට සමත් විය.

නර්තනායතනයේ වැඩි පිරිසක් සිසුවියන් වූ අතර බොහෝ අංග සිසුවියන්ගෙන් අනූන විය. සටන්කාමී නර්තන අංගවලට පවා සිසුවියන්ගේ දායකත්වය කැපී පෙණින. රෝහණ බැද්දගේ ශිල්පියාණන් ගැයූ "රාජා හෝ මංගලියා" ගීය සඳහා ඉදිරිපත් කළ නර්තනය ද සිත් ගත් අංගයක් විය. ලී කෙළි තවත් අපගේ කෙළි ගී ඇසුරින් කළ නර්තනයකි. වින්දිකා ගුණරත්න ගැයූ "සෝ ගී සුසුම්" ගීය සඳහා කළ නර්තනයට ස්පාඤ්ඤ නර්තන වින්‍යාසය ද මුසු විය. "සුපෙම් වී" ගීය වෙනුවෙන් ඉදිරිපත් වූයේ බැලේ නර්තන විලාශයයි. "අහන ඉන්න" ගීයත් විශාරද නන්දා මාලනීයගේ "දේවදාසී" ගීතයත් දරු දැරියන්ගේ හපන්කම් එළි දැක්වූ තවත් අංග දෙකකි. වෘත්තීය මට්ටමේ ශිෂ්‍යාවන් කණ්ඩායම ඉදිරිපත් කළ බොලිවුඩ් නර්තනයත්, තවත් කීපදෙනෙකු ඉදිරිපත් කළ ලතින් ඇමරිකානු නර්තනයත් ප්‍රසංගයට වෙනසක් එක් කිරීමට සමත් වූ අංගයි. ප්‍රියා සූර්යසේනයන්ගේ "හිරු ද මුවා වී" ගීය වෙනුවෙන් ඉදිරිපත් වූයේ කදිම ගැමි නර්තනයකි. "රාවණා" නව වසරේ ගීය වඩාත් ප්‍රසංගයේ මාතෘකාවට අදාල නර්ථන බවට පත් විණි.

රංගන උදුම්බරා නර්තන කණ්ඩායම වසර කීපයකට වරක් ඉදිරිපත් කරන "රංගාභිෂේක" ප්‍රසංගය වෙනුවෙන් නිර්මාණය වන ඇඳුම් ඇගළුම් චිත්තාකර්ශණීය ලෙස පිළියෙල කර ගැනීමට ඔවුහු වඩාත් උනන්දු වෙති. නර්තනයට අදාල දර්ශන පසු තිරයේ පෙළ ගැන්වූ සුමින්ද වනවාසවිතානගේ, බුද්ධික විජේරත්න දෙපලත් , ඊට ආලෝකකරණයෙන් දායක වූ සුපින් බණ්ඩාරත්, වේදිකාලංකරණය කළ ලාල් පෙරේරාත්, වීඩියෝ දර්ශන එක් කළ සුජීව මීහිටියත්, ශබ්ද පරිපාලනය කළ මනිල්කා විජේසේනත් ප්‍රසංගය වෙනුවෙන් දුන් දායකත්වය අගේ කළ යුතුයි. වේදිකා පරිපාලනයට දායක වූ ලාල් පෙරේරා, ලසත් හෙට්ටිගේ දෙපළත් ප්‍රසංගය ඉදිරිපත් කළ නිම්නා රූපසිංහ, සහ මධු රතුගම දෙපළත් සිය කර්තව්‍යය ඉහළින් ම ඉටු කළහ. වේදිකා පරිපාලනය කල සරත් බණ්ඩාර සුපුරුදු ලෙස සියල්ල මැනවින් පෙළගැස්වීමට සමත් විය. ප්‍රසංගයේ තිර රචනය, ඇතුළු සියලුදේ රංගන උදුම්බරා දෙපල අතින් ඉටු විය. මේ සියල්ල පසුපස නිරතුරුව කැප වී වෙහෙසෙන දෙමව්පියන් පිරිසත්, මේ සියල්ල අගයන රසික ප්‍රේක්ෂක පිරිසත් ඔවුනට නිබඳව දිරිය ලබා දෙති. ඒ දිනෙන් දින ශිල්පයෙන් ඉදිරියට යන සිසුන් වෙනුවෙනි. පන් තමන්ගේ ලියවිල්ල හමාර කළා.

